ලෝක ව්‍යාප්ත වසංගතයක්ව ඇති කොවිඩ්-19 හි ප්‍රභවය සම්බන්ධයෙන් කුමන්ත්‍රණ කල්පිතයන් අසන්නට ලැබෙන්නේ අද ඊයේ සිට නොවේ. කෙසේ වෙතත්, මෙම බොහෝ කුමන්ත්‍රණ කතාන්තරයන් ඉදිරිපත් වන්නේ නිසි විශ්වසනීය මූලාශ්‍ර වහල් කොටගනිමින් නොවේ. ඊට උදාහරණයක් ලෙසට දිවයින පුවත්පතේ මෙම ලිපිය පෙන්වා දිය හැක. එහිදී චීන බලධාරීන්, ඇමරිකානු ගත් කතුවරයෙකු වැනි නොපැහැදිලි මූලාශ්‍ර දක්වමින් නවකොරෝනා වෛරසයේ මූලාරම්භය දක්වා තිබේ.

නිශ්චිත මූලාශ්‍ර ලබානොදීම මෙහි ඇති එක් ගැටළුවකි. දෙවෙනුව, ලෝකයේ ඇති නිල වශයෙන් කරුණු විමසුම් කරනා සේවාවන් මගින් මෙම කුමන්ත්‍රණ කථාන්තර නිෂේධ කොට ඇති බව හෝ එම කුමන්ත්‍රණ කල්පිතයන් සම්බන්ධව පරස්පර මතගැටුම් ලෝකයේ පවතින බව හෝ මෙහි සඳහන් නොවීම ගැටළුවකි. තුන්වනුව, බිල් ගේට්ස්ව උපුටා දක්වමින් ඉස්මතු කොට ඇති කුමන්ත්‍රණ කල්පිතයක් සඳහා මෙම ලිපියේ රචකයාට මූලාශ්‍ර ලබාදිය හැකිදැයි යන්නද ගැටළුවකි.

මෙය වගකීම් සහගත මාධ්‍යකරණයද? ඒ පිළිබඳව ඔබේ අදහස කුමක්ද?

මූලාශ්‍ර:
https://euvsdisinfo.eu/.../coronavirus-might-be-us-bacteriol.../
https://www.factcheck.org/.../baseless-conspiracy-theories-c.../

සැලකිය යුතුයි: ඉහත සඳහන් වන කරුණු පදනම් වී ඇත්තේ අදාළ පෝස්ටු පළ කෙරෙනා මොහොත වන විට ලබාගැනීමට තිබූ වඩාත්ම යාවත්කාලීන තොරතුරු මත බව කරුණාවෙන් සලකන්න. ස්තුතියි.

#MediaEthicsSL #Sinhalapapers #lka #Divaina